---

**නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 02 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 02 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 දෙසැම්බර් 20 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

(අ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද ශේෂ පිරික්සුමෙහි හර හා බැර ශේෂයන්ගේ එකතු වටිනාකම් අතර රු.47,178 ක වෙනසක් විය.

(ආ). රු.6,229,327 ක කර්මාන්ත ණය ගැති ශේෂය, සාවද්‍ය අයුරින් ශේෂ පිරික්සුමේ බැර පැත්තෙහි දක්වා තිබුණි.

(ඈ). ප්‍රාදේශීය සභා සඳහා පිළිගත් ගිණුම් ක්‍රමය අනුව ස්ථාවර වත්කම් ගිණුම් ශේෂවල එකතුව ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම් ශේෂයට සමාන විය යුතු නමුත් එම ගිණුම් දෙක අතර රු.15,410,804 ක වෙනසක් පැවතුණි.

(ඇ). ශේෂ පිරික්සුම අනුව සමුච්චිත අරමුදල හා සංචිත ගිණුමෙහි ශේෂය රු.5,686,527 ක් වුවද පොදු ලෙජරය සහ මූල්‍ය ප්‍රකාශන වල එම ශේෂය රු.18,570,675 ක් ලෙස දක්වා තිබුණි.

(ඉ). රු.1,685,000 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම ද රු.558,650 ක් වූ යන්ත්‍රෝපකරණ වටිනාකම සහ රු.279,400 ක් වූ පරිගණක වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ඊ). ට්‍රැක්ටරයක සහ ටේලරයක වටිනාකම රු.1,065,000 ක් අඩුවෙන් ද ජල මෝටරයක වටිනාකම රු.10,000 ක් වැඩියෙන් ද ගිණුම් වල දක්වා තිබුණි.

(උ). ගෙවිය යුතුව තිබුණු රු.143,171 ක් උපචිත වියදම් ලෙස ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ඌ). 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.2,330,090 ක් වුවත් ආදායම් හා වියදම් ගිණුමේ එය රු.5,091,265 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.2,761,175 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(එ). දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබා ගත් රු.6,267,986 ක් වූ ණය, සහ ප්‍රදාන ලෙස ලැබුණු රු.10,853,426 ක් ගිණුම් වලට ගෙන නොතිබුණි.

1.3.2 **නොසැසඳූ ගිණුම්**

--------------------

ගිණුම් විෂයන් 7 කට අදාලව ගිණුමේ දක්වා තිබුණු ශේෂයන්ගේ එකතුව රු.28,429,779 වුවත් උපයෝගි ලේඛණ අනුව එම ශේෂයන්ගෙන් එකතුව රු.46,788,963 ක් විය.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 62,378,593 ක්වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,697,787 ක්වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 29,125 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

පහත සඳහන් මූල්‍ය පාලන ඌනතා නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 5(10) ප්‍රකාරව බැංකු ජංගම ගිණුමක් වෙනුවෙන් 2011 සැප්තැම්බර් මාසයෙන් පසුව බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.

(ආ). මාස 06 ක කාලය ඉක්මවූ එකතුව රු.11,596 ක්වූ චෙක්පත් 03 සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 264 ප්‍රකාරව ගෙවීම් වවුචර සඳහා කුවිතාන්සි ඉදිරිපත් කළයුතු වුවත් අවස්ථා 03 කදී එකතුව රු.45,478 ක ගෙවීම් සඳහා කුවිතාන්සි ලබාගෙන නොතිබුණි.

(ඈ). සභාව සතු බැංකු ඉතිරිකිරිමේ ගිණුමක පැවති රු. 16,503 ක ශේෂය 2002 වර්ෂයේ සිට නිශ්ක්‍රීයව පැවතුණි.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i). | බදු | 557 | 661 | - |
| (ii). | බදු කුලී | 1,027 | 971 | 72 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 334 | 220 | 7 |
| (iv). | වෙනත් ආදායම් | 9,645 | 8,055 | 1,590 |

**2.3.2 වරිපනම් හා බදු**

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 134 ( i ) වගන්තිය ප්‍රකාර දියුණු කළ ප්‍රදේශ වශයෙන් හඳුනා ගත් ප්‍රදේශ ප්‍රකාශයට පත්කර වරිපනම් බදු අයකිරිමට කටයුතු කර නොතිබුණි.

**2.3.3 බදුකුලී**

ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව නොසලකා කඩ කුලී අය කිරිම හේතුවෙන් රු.38,400 ක ආදායමක් අහිමි වී තිබුණි.

**2.3.4 කඩකුලී ආදායම්**

**---------------------**

පාලත් පාලන කොමසාරිස්ගේ 1994 අගෝස්තු 14 දිනැති අංක NCP/KG/09/07/19 දරන චක්‍රලේඛය ප්‍රකාරව පළාත් පාලන ආයතන වලට අයත් කඩ කාමර, වසර 05 කට වරක්වත් තක්සේරු කර කුලී අයකළ යුතු නමුත්, වසර 11 කට පෙර කරන ලද තක්සේරුව පදනම්ව කුලී අයකර තිබුණි.

**2.3.5 වෙනත් ආදායම්**

-------------------

සභා බල ප්‍රදේශය තුල භාවිතයට ගනු ලබන නළ ළිං වලින් අය විය යුතු රු.31,600 ක ගාස්තු අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

**2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**-------------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබු මුදල් පහත දැක්වේ.

| | | රු |
|---|---|---|
| (i). | උසාවි දඩ | 3,743,077 |
| (ii). | මුද්දර ගාස්තු | 2,197,480 |

**2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවු ගනුදෙනු**

**-------------------------------------------------------------**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය ප්‍රකාරව ලබාගත යුතු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන උත්සව හා පුද්ගලික ආධාර වශයෙන් එකතුව රු. 119,422 ක් වියදම් කර තිබුණි.

**2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ). සභාවේ පුරප්පාඩු වූ තනතුරු 15 ක් අනුමත කර ගැනීමට කටයුතු නොකර රු.2,589,375 ක් වැටුප් හා දීමනා ලෙස සභා අරමුදලින් ගෙවීම් කර තිබුණි.

(ආ). ඉදිරි වර්ෂවල ක්‍රියාකාරිත්වයට අදාල සැලසුම් ඇතුළත් සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීම සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය.
(ආ. අභ්‍යන්තර පාලනය.
(ඇ). ආදායම් පරිපාලනය
(ඈ). වත්කම් කළමනාකරණය
(ඉ). මානව සම්පත් කළමනාකරණය.